## අදාළ පරිච්ඡේද

1 වන පරිච්ඡේදය – නීතිය හැඳින්වීම

2 වන පරිච්ඡේදය - ගිවිසුම් නීතිය

3 වන පරිච්ඡේදය - භාණ්ඩ විකිණීමේ ආඥා පනත

4 වන පරිච්ඡේදය – නියෝජ්‍යාත්ව නීතිය

5 වන පරිච්ඡේදය – සමාගම් නීතිය සහ හවුල් ව්‍යාපාර

6 වන පරිච්ඡේදය – ගනුදෙනු කල හැකි ලියවිලි

7 වන පරිච්ඡේදය – කම්කරු නීතිය

8 වන පරිච්ඡේදය – රක්ෂණ නීතිය, කුලී සින්නක්කර සහ කල්බදු

9 වන පරිච්ඡේදය – ජාත්‍යන්තර වෙළඳ නීතිය

10 වන පරිච්ඡේදය – ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි

## ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- **A කොටස - OTQ (වෛෂයික පරීක්ෂණ ප්‍රශ්න)**
  - මුළු ප්‍රශ්න = 1
  - ප්‍රශ්න ව්‍යුහය = OTQ / සත්‍ය හෝ අසත්‍ය ප්‍රශ්න / කෙටි පිළිතුරු ප්‍රශ්න
  - මුළු ලකුණු = 25

- **B කොටස**
  - මුළු ප්‍රශ්න = 5
  - ප්‍රශ්න ව්‍යුහය = ඍජු ප්‍රශ්න.
  - උදාහරණයක් ලෙස, ප්‍රශ්න ඍජු වම සාකච්ඡා කිරීමට/පැහැදිලි කිරීමට/හඳුනා ගැනීමට/ අයිතිවාසිකම්/බැදීම්/අරමුණු/යුතුකම්/නෛතික බැඳීම්/පූර්ව අවශ්‍යතා//වැරදි ආදිය සඳහා අසනු ඇත.
  - මුළු ලකුණු = 50

JMC vLearning "your virtual learning partner"

- **සී කොටස**
  - මුළු ප්‍රශ්න = 1 (A කොටස සහ B කොටස)
  - ප්‍රශ්න ව්‍යුහය - ගැටළු ප්‍රශ්න
  - මුළු ලකුණු = 25

## 1 වන පරිච්ඡේදය – නීතියට හැඳින්වීම

- ප්‍රශ්න පදනම් වන්නේ MCQ මත පමණි.
- මෙම ප්‍රදේශයෙන් ප්‍රධාන ප්‍රශ්න නොමැත.
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න;
  - අධිකරණවල බලතල - ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය / මහාධිකරණය / දිසා අධිකරණය / මහේස්ත්‍රාත් අධිකරණය
  - පුද්ගලික නීති සහ රෝම-ලන්දේසි නීතිය
  - නීති මූලාශ්‍ර

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය;
  - මෙම කොටස "ඉගෙනීමට" හෝ "මතක තබා ගැනීමට" අනවශ්‍ය කාලයක් ගත නො කරන්න.
  - සංකල්පය කියවා තේරුම් ගන්න.
  - 2015 - 2023 දක්වා MCQ වල පසුගිය ප්‍රශ්න පත්‍ර ප්‍රගුණ කරන්න.

## 2 වන පරිච්ඡේදය – ගිවිසුම් නීතිය

- ගැටළු ප්‍රශ්නයක් සඳහා සූදානම් වන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
  - ගිවිසුම් නීතියට අදාළ මූලිකාංග
  - අර්පණය, ප්‍රතිග්‍රහණය, චේතනාව, ගිවිසුම් ශක්නුතාවය, නියම කැමැත්ත
  - කඩ වූ ගිවිසුමක් සම්බන්ධයෙන් තිබෙන ප්‍රතිකර්ම
  - ගිවිසුමකට අදාළ වගන්ති ( කොන්දේසි සහ ප්‍රතිඥාභාර)
  - ගිවිසුමේ වගකීමෙන් නිදහස් කෙරෙන වගන්ති (මුක්ත වගන්ති)

JMC vLearning "your virtual learning partner"

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය;
    - නඩු තීන්දු කියවීම් (බොහෝ ප්‍රශ්න පදනම් වන්නේ යම්කිසි නඩු තීන්දුවක් මතය).
    - පසුගිය ප්‍රශ්න පත්‍ර මත අවධානය යොමු කරන්න
    - මූලිකාංග වලට අදාළ හරය තේරුම් ගැනීමට උත්සාහ කරන්න සහ එය ඔබේ ම වචන වලින් ලිවීමට උත්සාහ කරන්න.
    - අත්‍යවශ්‍ය නඩු තීන්දු පමණක් මතක තබා ගන්න (සෑම මූලිකාංගයකට ම)

## <u>3 වන පරිච්ඡේදය - භාණ්ඩ විකිණීමේ ආඥා පනත</u>

- ගැටලු ප්‍රශ්න සහ ඍජු ප්‍රශ්න දෙකටම සූදානම් වන්න
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
    - වගන්ති 13/ 14 / 15 / 16
    - වගන්ති 19 (1) / 19(2) / 19(3) / 19(4) / 19(5)
    - නඩු තීන්දු - ප්‍රශ්නය ගොඩනැගෙන්නේ නඩු තීන්දුවක් මතය

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය
    - නඩු තීන්දු සහ වගන්ති පාඩම් කරන්න
    - පසුගිය ප්‍රශ්න පත්‍ර වල ට පිළිතුරු සපයන්න

## <u>4 වන පරිච්ඡේදය – නියෝජ්‍යත්ව නීතිය</u>

- ගැටලු ප්‍රශ්න සහ ඍජු ප්‍රශ්න දෙකටම සූදානම් වන්න
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
    - නියෝජ්‍යත්වයක් හට ගැනීම
    - නියෝජිතයෙකුගේ වගකීම් සහ අයිතිවාසිකම්
    - නියෝජ්‍යත් වය අවසන් කිරීම
- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය
    - සංකල්පයේ හොඳින් තේරුම් ගන්න
    - නඩු තීන්දු කියවන්න

JMC vLearning "your virtual learning partner"

- හැකි තාක් තමන්ගේ ම වචනයෙන් පිළිතුරු සපයන්න
- පසුගිය ප්‍රශ්න පත්‍ර වලට හොඳින් පිළිතුරු සපයන්න

## 5 වන පරිච්ඡේදය – සමාගම් නීතිය සහ හවුල් ව්‍යාපාර

- සෘජු ප්‍රශ්නයක් බලාපොරොත්තු විය හැක
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
  - සමාගමක නෛතික පුද්ගලභාවය
  - සමාගම් ව්‍යවස්ථාවලිය
  - අධ්‍යක්ෂවරයෙක් වීමට තිබිය යුතු සුදුසුකම්
  - අධ්‍යක්ෂවරයකුගේ යුතුකම්
  - සමාගමක් අවසන් කිරීම්

  - හවුල් ව්‍යාපාරයක් ඇති කිරීමට අවශ්‍ය කරුණු සහ හවුල් ව්‍යාපාරයකට බලපාන නීතිය
  - හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්
  - හවුල්කරුවෙකු ගේ යුතුකම්
  - හවුල් ව්‍යාපාරයක් අවසන් කරන ක්‍රම

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය
  - මෙයට බලපාන නීතිය හොඳින් තේරුම් ගන්න
  - තමන්ගේ වචන වලින් හැකිතාක් උත්තර සපයන්න
  - හවුල්කරුවෙකු ගේ යුතුකම් හොඳින් පාඩම් කරන්න
  - එකම ප්‍රශ්නය නැවත අසා තිබෙන බැවින් හොඳින් පසුගිය ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයන්න

## 6 වන පරිච්ඡේදය – ගනුදෙනු කල හැකි ලියවිලි

- සෘජු ප්‍රශ්නයක් බලාපොරොත්තු විය හැක
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
  - චෙක්පත් - වර්ග / චෙක් පතක් රේඛනය කිරීම/ බැංකුවලට ගෙවීම් ප්‍රතික්ෂේප කළ හැකි ආකාරය.
  - යථා කාලීන දාරකයෙකුගේ ලක්ෂණ
  - විනිමය බිල්පත්, චෙක්පත් සහ පොරොන්දු නෝට්ටු අතර වෙනස්කම්
  - විනිමය බිල් බිල්පත් ප්‍රතිග්‍රහණය කිරීම්

JMC vLearning "your virtual learning partner"

- ➢ ප්‍රතිග්‍රහණය කළ බිල්පත් සම්බන්ධයෙන් එය දරන්නෙකුට අනුගමනය කළ හැකි විවිධ ක්‍රියාමාර්ග
- ➢ විනිමය බිල්පත් ආඥා පනතේ බැංකුකරු ට දී ඇති ආරක්ෂාව ( වගන්ති 60 / 79 (2) / 80 / 82)

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය
  - ➢ සංකල්පය හොඳින් තේරුම් ගන්න.
  - ➢ එකම ප්‍රශ්නය නැවත අසා තිබෙන බැවින් හොඳින් පසුගිය ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයන්න

## <u>7 වන පරිච්ඡේදය – කම්කරු නීතිය</u>

- ගැටලු ප්‍රශ්න සහ ඍජු ප්‍රශ්න දෙකටම සූදානම් වන්න
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
  - ➢ සාප්පු සහ කාර්යාල පනත - නිවාඩු, මාතෘ ප්‍රතිලාභ, වැඩ කරන වේලාවන් සහ වැටුප්.
  - ➢ කම්කරුවන් සේවයෙන් පහකිරීම (විශේෂ විධිවිධාන) පනත
  - ➢ EPF / ETF / පාරිතෝෂිකය - අදාළ වන සහ අදාළ නොවන අයට සහ පාරිතෝෂිතය ගණනය කිරීම
  - ➢ පුද්ගලයෙකු සේවකයෙකු හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු දැයි හඳුනා ගැනීමට පරීක්ෂණ.
  - ➢ ගැටුම් නිරාකරණ ක්‍රම
- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය;
  - ➢ සංකල්පය හොඳින් තේරුම් ගන්න.
  - ➢ එකම ප්‍රශ්නය නැවත අසා තිබෙන බැවින් හොඳින් පසුගිය ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයන්න

## <u>8 වන පරිච්ඡේදය – රක්ෂණ නීතිය, කුලී සින්නක්කර සහ කල්බදු</u>

- රක්ෂණය සම්බන්ධයෙන් ගැටලු ප්‍රශ්න වලට ද, කුලී සින්නක්කර සහ බදු දීම සම්බන්ධයෙන් ඍජු ප්‍රශ්න වලට ද සූදානම් වන්න
- වැඩිපුර ප්‍රශ්න අසා තිබෙන්නේ රක්ෂණය සම්බන්ධයෙන් නමුත් ට ආසන්නතම අවුරුදු වල ප්‍රශ්න පත්‍රවල කුලී සින්නක්කර පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් අසා ඇත.
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
  - ➢ රක්ෂණයේ මූලධර්ම ( උපරිම විශ්වාසය / හානිපූරණය/ ආදේශනය/ දායකත්වය/ ආසන්නතම හේතුව/ රක්ෂණ හිමිකම)

JMC vLearning
"your virtual learning partner"

- රක්ෂණ වර්ග - වන්දි සහ හදිසි අවස්ථාව
- අයිතිකරුගේ සහ කුලියට ගත් අයගේ අයිතිවාසිකම් සහ බැදීම්
- බදු දීමනා කරු සහ  බදු ගැනුම්කරු හට අදාළ වන ප්‍රතිලාභ.

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය;
  - සංකල්පය හොඳින් තේරුම් ගන්න.
  - රක්ෂණය සම්බන්ධ ප්‍රශ්න සම විටම යම් නඩු තීන්දුවක් මත පදනම් වේ, එම නිසා නඩු තීන්දු කියවීම අනිවාර්යයෙන් කළ යුතුයි.
  - 2016 - 2023 දක්වා පසුගිය ප්‍රශ්න පත්‍ර පමණක් පුහුණු වන්න

## 9 වන පරිච්ඡේදය – ජාත්‍යන්තර වෙළඳ නීතිය

- ඍජු ප්‍රශ්න සඳහා සූදානම් වන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ  අවධානය යොමු කරන්න;
  - FOB සහ CIF.
  - FOB විකුණුම් කරුගේ සහ ගැනුම් කරුගේ වගකීම්
  - CIF විකුණුම් කරුගේ සහ ගැනුම් කරුගේ වගකීම්
  - නෞභාර පත්‍රය සහ එහි අශ්‍යතාවය
  - ජාත්‍යන්තර ගෙවීම් වර්ග - ණයවර ලිපිය ඉතා වැදගත් වේ.
  - ජාත්‍යන්තර ගැටුම් නිරාකරණ ක්‍රම

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය;
  - සංකල්පය හොඳින් තේරුම් ගන්න
  - පසුගිය ප්‍රශ්න පත්‍ර වලට පමණක් උත්තර සපයන්න

## <u>10 වන පරිච්ඡේදය – ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි</u>

- ඍජු ප්‍රශ්න සඳහා සූදානම් වන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න;
    - ➢ මුදල් විශුද්ධි කරණය වැළැක්වීමේ පනත
    - ➢ අල්ලස් පනත
    - ➢ පාරිභෝගික කටයුතු අධිකාරී පනත
    - ➢ බුද්ධිමය දේපළ පනත
    - ➢ පරිගණක අපරාධ පනත
    - ➢ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත

- නිර්දේශිත අධ්‍යයන ක්‍රමය;
    - ➢ එකම ප්‍රශ්න නැවත එන බැවින් පසුගිය ප්‍රශ්න පත්‍ර පමණක් පුහුණු වන්න.
    - ➢ සෑම දෙයක් ම කටපාඩම් කිරීමට උත්සාහ නො කරන්න, පසුගිය ප්‍රශ්නය පත්‍ර වල දී ඇති ප්‍රශ්න කෙරෙහි පමණක් අවධානය යොමු කරන්න.
    - ➢ 2016 සිට පරීක්ෂා කර ඇත.

JMC vLearning "your virtual learning partner"

# <u>පිළිතුරු ආකෘතිය</u>

- **පහත ආකෘතිය ප්‍රධාන වශයෙන් ගැටලු ප්‍රශ්නවලට පිළිතුරු දීමට භාවිතා කරයි. ඍජු ප්‍රශ්න සඳහා, අදාළ කරුණට පමණක් පිළිතුරු සැපයීම ප්‍රමාණවත් වේ.**

- හැඳින්වීම
- නීතිය
- අදාළ කිරීම
- අවසාන නිගමනය

JMC vLearning
"your virtual learning partner"

## 1) හැඳින්වීම

- අර්ථකතනයක් / සරල හැඳින්වීමක් මගින් ප්‍රශ්නයේ හරය හඳුනා ගැනීම.
- උදා : ගිවිසුමක් යනු පාර්ශව කරුවන් දෙදෙනෙකු ඊට වැඩි පිරිසක් අතර ඇති කර ගන්නා වූ නෛතික එකඟතාවක් ය.
- උදා: භාණ්ඩ විකිණීමක් යනු විකුණුම් කරු විසින් භාණ්ඩවල හිමිකම යම් මුදල් ප්‍රතිෂ්ඨාවක් මත ඔහුගෙන් ගැනුම්කරුට පැවරීම හෝ පැවරීමට එකඟ වීම ය.

## 2) නීතිය

- **යම් පනතක හෝ ආඥාපනතක වගන්ති** භාවිතා කරමින් හෝ **නඩු තීන්දු** භාවිතා කරමින් අදාළ නීතිය ප්‍රකාශ කිරීමට හැකයි.
- උදා : භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ **14 වන වගන්තිය** අනුව යම් භාණ්ඩයක් විස්තර කිරීමක් මත විකිණීමෙන් එම භාණ්ඩය එම විස්තර කිරීමට අනුරූප/සමාන විය යුතුයි. / භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ **16 වන වගන්තියට** අනුව යම් භාණ්ඩයක් සාම්පලයක් මත විකිණීමෙන් එම භාණ්ඩය එම සාම්පලය සමඟ අනුරූප විය යුතුයි.
- උදා : **Adams v Lindsay** නඩු තීන්දුවට අනුව පාර්ශවකරුවන් විසින් ප්‍රකාශිත ව හෝ ව්‍යංගයෙන් අර්පණය සඳහා ප්‍රතිග්‍රහණය කිරීමේ දී ලියුම් භාවිතා කිරීමට එකඟ වීමෙන් ගිවිසුම් නීතියේ සංකල්පයක් වන ශීඝ්‍ර තැපැල් න්‍යාය අදාළ වේ. එම නිසා ප්‍රතිග්‍රහණය සඳහා වන ලියුම එම ලියුම් පෙට්ටියට දැමීමෙන් ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වේ.
- උදා : FOB ජාත්‍යන්තර ගිවිසුමට අනුව භාණ්ඩ නෞකාවට පැටවීමෙන් භාණ්ඩවල හිමිකම් විකුණුම් කරුගෙන් ගැනුම්කරුට හුවමාරු වේ.

## 3) අදාළ කිරීම

- ඉහත කී නීතිය ප්‍රශ්නයට අදාළ ව ලිවීම් අදාළ කිරීම වේ.
- ප්‍රශ්නයේ දී තිබෙන ගැටළුව පැහැදිලි කිරීමට ඉහත කී නීතිය භාවිතා කිරීමෙන් ගැටළුවට අදාළ නෛතික පසුබිම ප්‍රකාශ කිරීම මෙයින් අදහස් කරයි.

JMC vLearning "your virtual learning partner"

- උදා: ඉහත කී නීතිය අදාළ කර ගනිමින් පැවසිය හැකි වන්නේ **සමන්** විසින් **කමල්** හට කළ අර්පණය ප්‍රතිග්‍රහණය සඳහා තැපැල් මාර්ගය භාවිතා කිරීමට එකඟ වීමෙන්, ශීඝ්‍ර තැපැල් න්‍යාය මෙම ගිවිසුමට අදාළ වන බවයි. එම නිසා කමල් කළ ප්‍රතිග්‍රහණය සමන් හට ලැබුණු දිනය **පෙබරවාරි මස 20** වන දින වුව ද, ඔහු එම ප්‍රතිග්‍රහණය සඳහන් ලිපිය තැපෑලට බාර දුන් දිනය වන **පෙබරවාරි මස 12** වන දින ගිවිසුමට එකඟ වූ බව නීතියෙන් පිළිගනී. එම නිසා, **සමන්** විසින් **සුමනා** වෙත භාණ්ඩ විකිණීම **පෙබරවාරි මස 18 වන දින කළ** ද, එම ගිවිසුම් වලංගු නොවන්නේ **කමල්** විසින් කළ අර්පණය එම දිනයට කලින් ( පෙබරවාරි මස 12) කළ බැවිනි. ශීඝ්‍ර තැපැල් න්‍යාය ට අනුව ප්‍රතිග්‍රහණය සැලකෙන්නේ අර්පණ කරුට ප්‍රතිග්‍රහණය ලැබුණු දිනය නොව එම ලිපිය තැපෑල ට භාර දුන් දිනයයි.

## 4) අවසාන නිගමනය

- අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුරු දීම මෙයින් අදහස් වෙයි
- සමන් සහ කමල් අතර වලංගු ගිවිසුමක් තිබේ දැයි ප්‍රශ්නයෙන් අසන්නේ නම් ඔබ එයට සෘජු ව පිළිතුරු දිය යුතු වේ.
- උදා: ඉහත කී දේ සලකා බැලීමේ දී සමන් සහ කමල් අතර වලංගු ගිවිසුමක් තිබෙන බවට පැවසිය හැකියි. / ඉහත කී නීතිය සහ ප්‍රශ්නයට අදාළ කර ගනිමින් පැවසිය හැකි වන්නේ සමන් සහ කමල් අතර වලංගු ගිවිසුමක් නො තිබෙන බවටයි.

JMC vLearning "your virtual learning partner"

## <u>පිළිතුරු ආකෘතිය භාවිතා කිරීමට ගැටළු ප්‍රශ්නයක්</u>

**සමන්** මහතා **කමල්** මහතාට ඔහුගේ මෝටර් රථය රුපියල් මිලියන **8** කට පිරිනැමීය. **සමන්** විසින් ප්‍රතිග්‍රහණය ට අදාළ ලිපිය තැපැල් මාර්ගයෙන් එවන ලෙස **කමල්** හට දැනුම් දුන්නේ ය. ඔහු **පෙබරවාරි මස 12** වැනි දින ප්‍රතිග්‍රහණය ට අදාළ ලිපිය තැපැලට භාර දුන්න ද තැපැල් දෙපාර්තමේන්තුවේ වැඩ වර්ජනයක් හේතුවෙන් එම ලිපිය **සමන්** වෙත ලැබුණු දිනය නම් **පෙබරවාරි මස 20** වනදා ය.

මෙම අතරවාරයේ දී **සමන්** ඔහුට ප්‍රතිග්‍රහණය සම්බන්ධ ලිපියක් නො ලැබීම හේතුවෙන් **කමල්** මහතාට ප්‍රතිග්‍රහණය ගැන උනන්දුවක් නැතැයි සිතා **සමන්** එය **පෙබරවාරි මස 15 වැනිදා සුමනා** වෙත විකුණයි. කමල් වලංගු ගිවිසුමක් ඇති බව පවසන නමුත් සමන් එය ප්‍රතික්ෂේප කරයි. මෙම පාර්ශවකරුවන් දෙදෙනා අතර වලංගු ගිවිසුමක් තිබේ ද යන්න සාකච්ඡා කරන්න.

## <u>පිළිතුර</u>

ගිවිසුමක් යනු නීතියෙන් බලාත්මක කළ හැකි පාර්ශවකරුවන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් අතර නෛතික බැඳීමක් ඇති ගිවිසුමකි. ගිවිසුමක් වාචික ව, ලිඛිත ව හෝ ව්‍යංගයෙන් ඇති වේ. කෙසේ වෙතත් ගිවිසුමක් වලංගු වන්නේ එහි මූලිකාංග එම ගිවිසුම තුළ අඩංගු වුනොත් පමණි. ( අර්පණය, ප්‍රතිග්‍රහණය, ප්‍රතිෂ්ඨා ව, ගිවිසුම් ශක්නුතාවය, නීත්‍යානුකූල බව, චේතනාව, චේතනාවේ වලංගු භාවය). මෙම ප්‍රශ්නයේ මූලික ගැටලුව වන්නේ ප්‍රතිග්‍රහණය සම්බන්ධවයි.

ප්‍රතිග්‍රහණය යනු කොන්දේසි විරහිත ව අර්පණය පිළිගැනීමයි. එය වලංගු වන්නේ

1) සන්නිවේදනය කිරීමෙන්
2) නිල වශයෙන් සන්නි සන්නිවේදනය කිරීමෙන් (Powell v Lee)
3) නිශ්ශබ්දතාවය ප්‍රතිග්‍රහණය ට ප්‍රමාණවත් නොවේ (Felthouse v Bindley)

**Adams v Lindsay** නඩු තීන්දුවට අනුව පාර්ශවකරුවන් විසින් ප්‍රකාශිත ව හෝ ව්‍යංගයෙන් අර්පණය සඳහා ප්‍රතිග්‍රහණය කිරීමේ දී ලියුම් භාවිතා කිරීමට එකඟ වීමෙන් ගිවිසුම් නීතියේ සංකල්පයක් වන ශීඝ්‍ර තැපැල් න්‍යාය අදාළ වේ. එම නිසා ප්‍රතිග්‍රහණය සඳහා වන ලියුම එම ලියුම් පෙට්ටියට දැමීමෙන් ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වේ.

JMC vLearning "your virtual learning partner"

ඉහත කී නීතිය **ප්‍රශ්නයට අදාළ කර ගනිමින්** පැවසිය හැක්කේ **සමන්** විසින් **කමල්** වෙත කළ අර්පණය ප්‍රතිග්‍රහණය කිරීමට **සමන්** සහ **කමල්** තැපැල මගින් එකඟ වීමෙන්, ශීඝ්‍ර තැපැල් න්‍යාය අදාළ වන බවයි. මෙහි දී **කමල්** විසින් ප්‍රතිග්‍රහණය දන්වා යැවූ ලිපිය ඔහු තැපැලට දැමූ දිනය නම් **පෙබරවාරි මස 12** වන දිනයයි. නමුත් තැපැල් දෙපාර්තමේන්තුවේ වැඩ වර්ජනයක් හේතුවෙන් එම ප්‍රතිග්‍රහණය ට අදාළ ලිපිය සමන් වෙත ලැබුණු දිනය වන්නේ **පෙබරවාරි මස 20 වන දා ය.** සමන් එම අතරවාරයේ දී අනුමාන කරන ලද්දේ කමල් ඔහුගේ අර්පණය ප්‍රතිග්‍රහණය කිරීමට කැමැත්තක් නො දක්වන බවටයි. එම නිසා සමන් **පෙබරවාරි මස 18 වන** දින සුමනා වෙත ඔහුගේ මෝටර් රථය විකුණන ලද නමුත් ශීඝ්‍ර තැපැල් න්‍යාය ට අනුව ප්‍රතිග්‍රහණය ට අදාළ ලිපිය අර්පණ කරුට ලැබුණ දින නොව එය තැපැලට බාර දුන් දිනය ප්‍රතිග්‍රහණය ට අදාළ දිනය ලෙස සැලකේ.

එම නිසා **අවසානයට නිගමනය** කළ හැක්කේ ඉහත කී නීතිය ගැටළුවට අදාළ කර ගනිමින් සමන් සහ කමල් අතර වලංගු ගිවිසුමක් තිබෙන බවට ය. එම හේතුවෙන් කමල් සහ සුමනා අතර තිබෙන ගිවිසුම් වලංගු නොවන බැවින්, සමන් සුමනා සමග ඇති කර ගත් ගිවිසුම අවලංගු කොට එම මෝටර් රථය කමල් වෙත භාර දිය යුතු වේ.

JMC vLearning "your virtual learning partner"